# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2261/53 - 2022 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2013(ii)

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 321 වන වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රෝහිත අබේගුණවර්ධන,**
වරාය හා නාවික අමාත්‍ය.

2021 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මේ නියෝග 2021 අංක 5 දරන වෙළඳ නැව් (රේඩියෝ සන්නිවේදන) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

(2) 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ IV වන පරිච්ඡේදය, කලින් කලට සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදු කරනු ලබන යම් සංශෝධන බලාත්මක කිරීම මේ නියෝගවල කාර්යය විය යුතු ය.

I වන කොටස

*මෙම නියෝගවල අදාළත්වය*

2. (1) මේ නියෝගයේ (2), (3), (4) වන අනු නියෝගවල විධිවිධානයන්ට යටත්ව, මේ නියෝග ශ්‍රී ලංකාවේ ධජය දැරීමට හිමිකම් ඇති ජාත්‍යන්තර මුහුදු ගමන්හි යෙදෙන නෞකාවලට සහ ශ්‍රී ලංකා ජල තීරයේ ඇති වෙනත් යම් විදේශීය නෞකාවලට අදාළ විය යුතු ය.

(2) (මේ නියෝගයන්හි "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය, 1988 ප්‍රොටොකෝලය, අන්‍යාකාරයෙන් ප්‍රකාශිතව විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ නියෝග

(*අ*) යුධ නැව් සහ හමුදා නැව් සඳහා;
(*ආ*) දළ ටොන් බර 300 ට අඩු භාණ්ඩ නැව් සඳහා;
(*ඇ*) යාන්ත්‍රික ක්‍රම මගින් ප්‍රචලනය කරනු නොලබන නැව් සඳහා;
(*ඈ*) පුරාතනයේ ඉදිකළ දැවමය නැව් සඳහා;
(*ඉ*) වෙළෙඳාමේ නිරත නොවන විනෝද ගමන් යාත්‍රා සඳහා; සහ
(*ඊ*) ධීවර යාත්‍රා සඳහා,

අදාළ නොවිය යුතු ය.

(3) සම්මුතියේ අන්‍යාකාරයෙන් අදාළවන ශ්‍රී ලාංකික නැව් උතුරු ඇමරිකාවේ මහාවිල් සහ කැනඩාවේ ක්වෙබෙක් පළාතේ මොන්ට්‍රියෙල් හි ශාන්ත ලැම්බර්ට් ලොක් හි පහළ පිටවීමට තරම් නැගෙනහිර දුරට පිහිටි ඒවායේ සම්බන්ධිත සහ ශාඛා ජාල තීරය තුළ යාත්‍රා කරනු ලබන අතරතුර දී එම ශ්‍රී ලාංකික නැව් සඳහා මේ නියෝග අදාළ නොවිය යුතු ය.

(4) මේ නියෝගවල සඳහන් කිසිදු විධිවිධානයක් මගින් යම් නැවක්, ගලවා ගැනීමේ බෝට්ටුවක් හෝ ආපදාවට පත් තැනැත්තකු විසින් අවධානය ලබා ගැනීම, ඔවුන් සිටින ස්ථානය පිළිබඳව දැනුවත් කිරීම සහ සහය ලබා ගැනීම සඳහා ඔවුන් සතුව පවතින යම් ආකාරයක් භාවිත කිරීම වළක්වාලනු නොලැබිය යුතු ය.

3. (1) නමුත් සාමාන්‍යයෙන් ජාත්‍යන්තර මුහුදු ගමන්වල නොයෙදෙන විශේෂ අවස්ථානුගත කරුණුවල දී තනි ජාත්‍යන්තර මුහුදු ගමනක් සිදු කිරීම සඳහා නියම කරනු ලබන නැවක් (මේ නියෝගවල "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" ලෙස සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මේ නියෝගවල සඳහන් යම් නියමයන්ගෙන් නිදහස් කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, නැව විසින් සිදු කරනු ලැබිය යුතු මුහුදු ගමන සඳහා ප්‍රමාණවත් වන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ මතය වන ආරක්ෂක නියමයන්ට අනුකූලව එකී නැව කටයුතු සිදු කරනු ලැබිය යුතු ය.

(2) (*අ*) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, නවීන වර්ගයක අංග ලක්ෂණ සහිත යම් නැවක්, ජාත්‍යන්තර මුහුදු ගමන් හි යෙදෙන නැව්වල අංග ලක්ෂණ සංවර්ධනය කිරීම සඳහා සහ ඒවා සවි කිරීම පිළිබඳ පර්යේෂණය කිරීම බරපතල ලෙස වළක්වනු ලැබිය හැකි යම් විධිවිධානවල අදාළත්වය සම්බන්ධයෙන් සම්මුතියේ II-1, II-2, III සහ IV වන පරිච්ඡේදවල යම් විධිවිධානයකින් නිදහස් කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, නැව මගින් ලබා දීමට අපේක්ෂිත සේවාව ලබා දීම සඳහා ප්‍රමාණවත් වන බවට සහ නැවේ සම්පූර්ණ ආරක්ෂාව පිළිබඳව සහතික කිරීම සඳහා වන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ මතය වන සහ නැව ගමන් කරනු ලබන රාජ්‍යයන්ගේ රජයන් විසින් පිළිගන්නා ලද ආරක්ෂක නියමයන්ට අනුකූලව එම නැව් කටයුතු සිදු කරනු ලැබිය යුතු ය.

(*ආ*) 2(අ) වන අනු නියෝග යටතේ නිදහස් කිරීම් සඳහා අවසර දෙනු ලබන අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඒ පිළිබඳව විස්තර සහ ඒ සඳහා හේතු (මේ නියෝගවල "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

4. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, තනි නැව් සඳහා සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 7 වන නියෝගයේ සිට 11 වන නියෝගය දක්වා වන නියෝගවල නියමයන්ගෙන් අර්ධ හෝ කොන්දේසි සහිත නිදහස් කිරීම් ප්‍රදානය කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද,

*(අ)* එකී නැව් මේ නියෝගයන් හි 6 වන නියෝගයේ කාර්යාත්මක නියමයන්ට අනුකූල විය යුතු ය; සහ

*(ආ)* සෑම නැවකම ආරක්ෂාව සඳහා සේවාවේ සාමාන්‍ය කාර්ය කාර්යක්ෂමතාවය මත එම නිදහස් කිරීම් බලපානු ලැබිය හැකි ආකාරය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සැලකිල්ලට ගෙන තිබිය යුතු ය.

(2) *(අ)* ආරක්ෂාවට බලපානු ලබන කොන්දේසි සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 7 වන නියෝගයේ සිට 11 වන නියෝගය දක්වා වන නියෝග සම්පූර්ණයෙන් අදාළ වීම අයුක්ති සහගත වීමට හෝ අනවශ්‍ය වීමට ඉඩ හරිනු ලබන්නේ නම්; සහ

*(ආ)* විශේෂ අවස්ථානුගත කරුණුවල දී, නැව සූදානම් කරන ලද මුහුදු ප්‍රදේශයෙන් හෝ මුහුදු ප්‍රදේශවලින් පිටත තනි මුහුදු ගමනක් සඳහා,

පමණක් I වන අනු-නියෝගය යටතේ නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(3) පෙර ලිත් වර්ෂය තුළ 1 වන සහ 2 වන අනු නියෝග යටතේ ප්‍රදානය කරන ලද සියලු නිදහස් කිරීම් පෙන්වමින් සහ එකී නිදහස් කිරීම් ප්‍රදානය කිරීම සඳහා වන හේතු දක්වමින් වාර්තාවක් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සෑම වර්ෂයක ම ජනවාරි මස පළමුවන දිනට පසු හැකි ඉක්මණින් සංවිධානය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. (1) 3 වන සහ 4 වන නියෝගවල දැක්වෙන නිදහස් කිරීම් 2022.01.06 වැනි දින අංක 2261/49 දරන *ගැසට්* පත්‍රයේ පළකරන ලද අංක 01 දරන වෙළෙඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝගවලට අනුකූලව නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) සම්මුතියේ IV පරිච්ඡේදය මගින් නියම කරනු ලබන අනුමතයක් හෝ ආදර්ශ අනුමතියක්-

*(අ)* ලිඛිත වන්නේ නම්;
*(ආ)* එය බලාත්මකවන දිනය එහි නිශ්චිතව දක්වනු ලබන්නේ නම්; සහ
*(ඇ)* එහි සඳහන් කරන ලද යම් කොන්දේසි අනුකූල වන්නේ නම්,

පමණක් වලංගු විය යුතු ය.

(3) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මේ නියෝග යටතේ ප්‍රදානය කරන ලද යම් නිදහස් කිරීමක් හෝ අනුමතයක් සාධාරණ දැනුම්දීමකින් වෙනස් කිරීම, අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### *කාර්යාත්මක නියමයන්, රේඩියෝ සවි කිරීම් සහ රේඩියෝ උපකරණ*

6. මුහුදේ දී සෑම නැවකට ම-

(අ) සම්මුතියේ IV පරිච්ඡේදයේ 8.1.1 වන සහ 10.1.4.3 වන නියෝගවල විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, එක් එක් ආකාරයන් වෙනස් රේඩියෝ සන්නිවේදන සේවයක් භාවිත කරමින්, අවම කරමින් වෙන් වූ සහ ස්වාධීන ආකාරයන් දෙකක් මගින් නැවේ සිට වෙරළ දක්වා ආපදා සංඥාවක් සම්ප්‍රේෂණය කිරීමට;

(ආ) වෙරළ සිට නැව දක්වා ආපදා සංඥාවක් ලැබීමට;

(ඇ) නැවේ සිට නැව දක්වා ආපදා සංඥා සම්ප්‍රේෂණය කිරීමට සහ ලැබීමට;

(ඈ) සෙවීම සහ ගලවා ගැනීම සම්බන්ධීකරණ සන්නිවේදනයන් සම්ප්‍රේෂණය කිරීමට සහ ලැබීමට;

(ඉ) ස්ථානීය සන්නිවේදන සම්ප්‍රේෂණය කිරීමට සහ ලැබීමට;

(ඊ) පිහිටි ස්ථානය දැන ගැනීමේ සංඥා සම්ප්‍රේෂණය කිරීමට සහ සම්මුතියේ V වන පරිච්ඡේදයේ 19.2.3.2 වන නියෝගය මගින් නියම කරනු ලබන පරිදි පිහිටි ස්ථානය දැන ගැනීමේ සංඥා ලැබීමට;

(උ) සමුද්‍රීය ආරක්ෂාව පිළිබඳ තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට සහ ලැබීමට;

(ඌ) සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 15.8 වන නියමයට යටත් වෙරළ පාදක රේඩියෝ පද්ධති හෝ ජාලයන් වෙත සහ ඒවායින් පොදු රේඩියෝ සන්නිවේදන සම්ප්‍රේෂණය කිරීමට සහ ලැබීමට; සහ

(එ) නියමු මැදිරියක සිට නියමු මැදිරියක් දක්වා සන්නිවේදන සම්ප්‍රේෂණය කිරීමට සහ ලැබීමට,

හැකි විය යුතු ය.

7. (1) සෑම නැවකට ම, එම නැවෙහි අපේක්ෂිත මුහුදු ගමන පුරාවට 6 වන නියෝගයෙන් නියම කරනු ලබන කාර්යාත්මක නියමයන්ට අනුකූල වීමට සහ 4 වන නියමය යටතේ නිදහස් කිරීමක දී හැර, සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 7 වන නියෝගයේ නියමයන්ට අනුකූල වීමට සහ, මුහුදු ප්‍රදේශ හෝ නැවේ අපේක්ෂිත මුහුදු ගමන අතරතුර දී එය පසුකරනු ලබන ප්‍රදේශ සඳහා සුදුසු පරිදි සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 8, 9, 10 වන නියෝගවල හෝ 11 වන නියෝගයේ නියමයන්ට අනුකූල වීමට හැකිවන රේඩියෝ සවි කිරීම් ලබා දිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන අනු නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති සෑම රේඩියෝ සවි කිරීමක් ම;

(අ) යාන්ත්‍රික, ඉලෙක්ට්‍රොනික හෝ වෙනත් ප්‍රභවයක කිසිදු අහිතකර මැදිහත්වීමක් එහි නිසි භාවිතයට බලපෑම් නොකරන ආකාරයෙන් සහ විද්‍යුත් චුම්බක අනුකූලතාව සහතික වන පරිදි සහ වෙනත් උපකරණ සහ පද්ධතීන් සමග අහිතකර බල පැවැත්වීම වළක්වාලන පරිදි පිහිටුවනු ලැබිය යුතු ය;

(ආ) ආරක්ෂාවේ හැකි උපරිම මට්ටම සහ මෙහෙයුම් උපයෝගිතාව සහතික කිරීමට හැකිවන පරිදි පිහිටුවනු ලැබිය යුතු ය;

(ඇ) ජලයේ, උෂ්ණත්වයේ උපරිම සීමාවන්ගේ සහ අනෙකුත් අහිතකර පාරිසරික තත්ත්වයන්ගේ අහිතකර බලපෑම්වලට එරෙහිව ආරක්ෂා කරනු ලැබිය යුතු ය;

(ඈ) රේඩියෝ සවි කිරීම් මෙහෙයවීම සඳහා රේඩියෝ පාලන උපකරණ ප්‍රමාණවත්ව ආලෝකමත් කිරීම සඳහා ප්‍රධාන සහ හදිසි ඉලෙක්ට්‍රොනික බල මූලාශ්‍රයන්ගෙන් ස්වාධීනව, විශ්වාසදායක, ස්ථිර ලෙස සකස් කරන ලද ඉලෙක්ට්‍රොනික අලෝක කිරීම් සහිතව ලබා දිය යුතු ය; සහ

(ඉ) කැඳවුම් සංඥාව, නැව් ස්ථාන අනන්‍යතාවය සහ රේඩියෝ සවි කිරීමේ භාවිතයට අදාළ වන වෙනත් කේත මගින් පැහැදිලිව සළකුණු කරනු ලැබිය යුතු ය.

8. සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 7 වන නියෝගයේ නියමයන් සම්පූර්ණ කිරීමට අමතරව, සම්පූර්ණයෙන් අ1 වන මුහුදු ප්‍රදේශයේ මුහුදු ගමන්වල යෙදෙන, සෑම නැවකට ම සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 8 වන නියෝගයට අනුකූලව රේඩියෝ සවි කිරීමක් ලබා දිය යුතු ය.

9. සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 7 වන නියෝගයේ නියමයන් සම්පූර්ණ කිරීමට අමතරව, අ1 වන මුහුදු ප්‍රදේශයෙන් එපිට මුහුදු ගමන්වල යෙදෙන, නමුත් අ2 වන මුහුදු ප්‍රදේශය තුළ නතරව සිටින සෑම නැවකටම සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 9 වන නියෝගයට අනුකූලව රේඩියෝ සවි කිරීම් සහ උපකරණ ලබා දිය යුතු ය.

10. සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 7 වන නියෝගයේ නියමයන් සම්පූර්ණ කිරීමට අමතරව, අ1 වන සහ අ2 මුහුදු ප්‍රදේශයන්ගෙන් එපිට මුහුදු ගමන්වල යෙදෙන, නමුත් අ3 වන මුහුදු ප්‍රදේශය තුළ නතරව සිටින සෑම නැවකටම සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 10 වන නියෝගයට අනුකූලව රේඩියෝ සවි කිරීම් සහ උපකරණ ලබා දිය යුතු ය.

11. සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 7 වන නියෝගයේ නියමයන් සම්පූර්ණ කිරීමට අමතරව, සෑම ප්‍රදේශයක ම මුහුදු ගමන්වල යෙදෙන සෑම නැවකට ම සම්මුතියේ සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 11 වන නියෝගයට අනුකූලව රේඩියෝ සවි කිරීම් සහ උපකරණ ලබා දිය යුතු ය.

## III වන කොටස

### *මුරකාවල් සේවා සහ ශක්තා මූලාශ්‍ර*

12. (1) මුහුදේ සිටින අතරතුර සෑම නැවක් විසින් ම සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 12වන නියෝගයට අනුකූලව අඛණ්ඩව මුරකාවල් සේවාවන් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) මුහුදේ සිටින අතරතුර සෑම නැවක් විසින් ම, නැව යාත්‍රාකරනු ලබන ප්‍රදේශය සඳහා සමුද්‍රීය සුරක්ෂිතභාවය පිළිබඳ තොරතුරු ප්‍රචාරය කරනු ලබන සුදුසු සංඛ්‍යාතයෙන් හෝ සංඛ්‍යාතවලින් එම සමුද්‍රීය සුරක්ෂිතභාවය පිළිබඳ තොරතුරු ප්‍රචාරය කිරීම සඳහා රේඩියෝ මුරකාවල් සේවයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

13. සම්මුතියේ IV වන පරිච්ඡේදයේ 13 වන නියෝගයට අනුකූලව, රේඩියෝ සවි කිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා සහ රේඩියෝ සවි කිරීම් සඳහා සංචිත මූලාශ්‍රයක හෝ ශක්ති මූලාශ්‍රවල කොටසක් ලෙස භාවිත කරනු ලබන යම් බැටරි ආරෝපණය කිරීම සඳහා ප්‍රමාණවත් වන ඉලෙක්ට්‍රොනික ශක්ති සැපයුමක් නැව මුහුදේ තිබෙන අතරතුර සෑම අවස්ථාවක දී ම පැවතිය යුතු ය.

## IV වන කොටස

### *ක්‍රියාකාරී ප්‍රමිතීන් සහ පවත්වාගෙන යාමේ නියමයන්*

14. (1) මේ නියෝගයන් අදාළ වන සෑම උපකරණයක් ම අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරන ලද වර්ගයක විය යුතු ය. එම උපකරණ සංවිධානය විසින් පිළිගත් ප්‍රමිතීන්ට අඩු නොවන සුදුසු ක්‍රියාකාරී ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන අනුනියෝගය ප්‍රකාරව අනුමතයන් සම්මුතියේ නියමයන්ට සම්පූර්ණයෙන් අනුකූල වුවහොත්, පිළිගත් සංවිධානයක් (ආර්.ඕ) හෝ එක්සත් ජනපද වෙරළාරක්ෂණ, එක්සත් රාජධානියේ සමුද්‍රීය වෙරළාරක්ෂණ නියෝජ්‍යායතනය හෝ ජපානයේ සුමුද්‍රීය පරිපාලනය විසින් ප්‍රදානය කරන ලද උපකරණ අනුමතයන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගනු ලබයි.

15. (1) නැවත අංක ශෝධන විස්තර දැක්වීමෙන් හෝ නැවත සැකසීමෙන් තොරව, ප්‍රධාන ඒකක පහසුවෙන් ආදේශ කළ හැකි වන ආකාරයෙන් උපකරණයක් නිර්මාණය කරනු ලැබිය යුතු ය.

(2) උපකරණයක් අදාළ වන විට දී, පරීක්ෂා කිරීම සඳහා සහ නැවේ නඩත්තු කිරීමේ කාර්යයන් සඳහා පහසුවෙන් ප්‍රවේශවිය හැකි ආකාරයෙන් සාදා සවිකරනු ලැබිය යුතු ය.

(3) සංවිධානයේ නිර්දේශයන් සැලකිල්ලට ගනිමින්, උපකරණ නිසි ලෙස ක්‍රියාකරවීමට සහ නඩත්තු කිරීමට ඉඩ සැලැස්වීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා දෙනු ලැබිය යුතු ය.

(4) උපකරණ නඩත්තු කිරීමට ඉඩ සැලැස්වීම සඳහා ප්‍රමාණවත් මෙවලම් සහ අමතර කොටස් ලබා දෙනු ලැබිය යුතු ය.

(5) මේ නියෝග මගින් නියම කරනු ලබන රේඩියෝ උපකරණ, 6 වන නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන කාර්යාත්මක නියමයන් ලබා ගැනීමට සහ එම උපකරණයෙන් නිර්දේශිත ක්‍රියාකාරී ප්‍රමිතීන් සපුරාලීමට කටයුතු සැලැස්වීම සඳහා නඩත්තු කරනු ලැබිය යුතු ය.

(6) අ1 වන සහ අ2 වන මුහුදු ප්‍රදේශවල මුහුදු ගමන්වල නිරතව සිටින නැව් මත කාර්යාත්මක නියමයන් ලබා ගැනීම අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි, උපකරණ අනුපිටපත් කිරීම, වෙරළේ සිට ක්‍රියාත්මක වන නඩත්තු කිරීම හෝ මුහුදේ දී විද්‍යුත් නඩත්තු කිරීමේ හැකියාව හෝ මෙම ක්‍රමවල සුසංයෝගයක් යන ක්‍රම භාවිත කිරීම මගින් සහතික කරනු ලැබිය යුතු ය.

(7) අ3 වන සහ අ4 වන මුහුදු ප්‍රදේශවල මුහුදු ගමන්වල නිරතව සිටින නැව් මත කාර්යාත්මක නියමයන් ලබා ගැනීම සංවිධානයේ නිර්දේශ සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි උපකරණ අනුපිටපත් කිරීම, වෙරළේ සිට ක්‍රියාත්මක වන නඩත්තු කිරීම හෝ මුහුදේ දී විද්‍යුත් නඩත්තු කිරීමේ හැකියාව වැනි ක්‍රමවලින් යටත් පිරිසෙයින් ක්‍රම දෙකක වත් සුසංයෝගයක් භාවිත කිරීම මගින් සහතික කරනු ලැබිය යුතු ය.

(8) 6 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලබන සියලු කාර්යාත්මක නියමයන්ට අනුකූල වන බවට සහතික කිරීම සඳහා උපකරණ කාර්යක්ෂමව ක්‍රියා කිරීම පවත්වාගෙන යාමට අදාළ සියලු යුක්ති සහගත පියවර ගනු ලැබිය යුතු නමුත්, නැවට සියලු ආපදා සහ ආරක්ෂක කාර්තව්‍ය ඉටුකිරීමේ හැකියාව පවතින්නේ නම්, 6(උ) වන නියෝගයෙන් නියම කරනු ලබන සාමාන්‍ය රේඩියෝ සන්නිවේදන සැපයීම සඳහා වන උපකරණ නිසි ලෙස ක්‍රියා නොකිරීම නැව මුහුදේ යාත්‍රා කිරීමට යෝග්‍ය නොකිරීමක් ලෙස හෝ අලුත්වැඩියා කිරීමේ පහසුකම් පහසුවෙන් ලබාගත නොහැකි අවස්ථාවක දී, වරායේ තිබෙන නැවක් ප්‍රමාද කිරීම සඳහා හේතුවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(9) සැටලයිට් EPIRB –

(අ) මෙහෙයුම් සංඛ්‍යාත මත නිකුත් කිරීම, කේතගත කිරීම සහ ලියාපදිංචි කිරීම පරීක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවදානයක් යොමු කරමින් පහත නිශ්චිතව දක්වා ඇති පරිදි විරාමවල දී මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ සියලු අංශ සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබිය යුතු ය-

(i) මගී නැව් ආරක්ෂක සහතිකය කල් ඉකුත් වීමේ දිනයට පෙර මාස තුනක් ඇතුළත මගී නැව් මත; සහ

(ii) භාණ්ඩ නැව් ආරක්ෂක සහතිකය කල් ඉකුත් වීමේ දිනයට පෙර මාස 3 ක් ඇතුළත් හෝ සංවත්සර දිනයට පෙර හෝ පසු මාස 3 ක් ඇතුළත භාණ්ඩ නැව් මත,

පරීක්ෂණය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නැවක් මත හෝ අනුමත කරන ලද පරීක්ෂණ ස්ථානයක දී පවත්වනු ලැබිය හැකි ය; සහ

(ආ) සංවිධානය විසින් දියුණු කරන ලද මාර්ගෝපදේශවලට අනුව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කර ඇති අනුමත කරන ලද වෙරළේ සිට ක්‍රියාත්මක වන නඩත්තු කිරීමේ පහසුකමක දී ඉටුකරනු ලබන, අවුරුදු පහ නොඉක්මවන විවේකයන්වල දී කරනු ලබන නඩත්තු කිරීමට යටත් විය යුතු ය.

16. මේ නියෝග අදාළවන සියලු ශ්‍රී ලංකික නැව්වල, සාමාන්‍යයෙන් 17 වන නියෝගය යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන නෞකාධිපතිවරයා විසින් නම් කරන ලද තැනැත්තකු විසින් නැව මුහුදේ තිබිය දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පළ කරන ලද ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් මගින් නියම කරනු ලබන පරිදි නිසි පරීක්ෂණය සිදුකරනු ලැබිය යුතු ය. මේ නියෝග මගින් නියම කරන ලද යම් රේඩියෝ සවි කිරීමක් ක්‍රියා කිරීමේ තත්ත්වයේ නොපවතින්නේ නම් ඒ පිළිබඳව නම් කරන ලද තැනැත්තකු විසින් නෞකාධිපතිවරයාට දැනුම් දිය යුතු අතර අඩුපාඩු පිළිබඳ තොරතුරු පහත දැක්වෙන 18 වන නියෝගයේ සඳහන් කරන ලද ගුවන්විදුලි ලොග් පොතෙහි වාර්තා කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

### *ගුවන්විදුලි සේවක පිරිස, ගුවන් විදුලි වාර්තා සහ පිහිටි ස්ථානය යාවත්කාලීන කිරීම*

17. (1) සෑම නැවක් විසින් ම මේ නියෝගයේ (3) වන හෝ (4) වන පරිච්ඡේදවල නිශ්චිතව දක්වා ඇති පරිදි ආපදා සහ ආරක්ෂක රේඩියෝ සන්නිවේදන කාර්ය සඳහා සුදුසුකම්ලත් සේවක පිරිසක් ගෙන යා යුතු ය. එම සේවක පිරිස සුදුසු පරිදි ගුවන්විදුලි නියෝගවල නිශ්චිතව දක්වා ඇති සහතික දරන්නන් විය යුතු ය.

(2) (අ) මගී නැව් සම්බන්ධයෙන් ආපදා අවස්ථාවන්හි දී රේඩියෝ සන්නිවේදන පමණක් ඉටු කිරීම සඳහා ඉහත (1) වන උපනියෝගයේ සඳහන් කර ඇති පරිදි වන යම් තැනැත්තකු වත් නෞකාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(ආ) වෙනත් සියලු නැව් සම්බන්ධයෙන් ආපදා අවස්ථාවන්හි දී රේඩියෝ සන්නිවේදන කිරීම සඳහා වන ප්‍රධාන වගකීම දැරීම සඳහා ඉහත (1) වන උපනියෝගයේ සඳහන් කර ඇති පරිදි වන යම් තැනැත්තකු නෞකාධිපතිවරයා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(3) (අ) අ1 මුහුදු ප්‍රදේශයේ වෙළඳාමේ යෙදෙන නැව් මත, ඉහත (1) වන උපනියෝගයේ සඳහන් කර ඇති පරිදි සුදුසුකම්ලත් තැනැත්තා යටත් පිරිසෙයින් ගුවන් විදුලි නියෝගවලට අනුකූලව නිකුත් කරන ලද GMDSS සීමිත ගුවන් විදුලි

ක්‍රියාකරු සහතිකයක් සහ 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *ගැසට්* පත්‍රයේ පළ කරන ලද 2016 වෙළෙඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝගවලට අනුකූලව නිකුත් කරන ලද GMDSS සීමිත ගුවන් විදුලි ක්‍රියාකරුවකු වශයෙන් නිපුණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය.

(4) අ2 වන, අ3 සහ 4 වන මුහුදු ප්‍රදේශවල වෙළඳාමේ යෙදෙන නැව් මත, ඉහත (1) වන උපනියෝගයේ සඳහන් කර ඇති පරිදි සුදුසුකම්ලත් තැනැත්තා යටත් පිරිසෙයින් ගුවන්විදුලි නියෝගවලට අනුකූලව නිකුත් කරන ලද GMDSS සාමාන්‍ය ගුවන් විදුලි ක්‍රියාකරු සහතිකයක් සහ 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝගවලට අනුකූලව නිකුත් කරන ලද DMDSS ගුවන් විදුලි ක්‍රියාකරු වශයෙන් නිපුණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය.

18. (1) සෑම නැවකම GMDSS ගුවන් විදුලි ලොක් පොත යනුවෙන් හඳුන්වනු ලබන වාර්තාවක් තැබිය යුතු අතර එම ලොග් පොතෙහි පහත දැක්වෙන තොරතුරු වාර්තා කරනු ලැබිය යුතු ය :

(අ) සන්නිවේදනවල වේලාවද සමග නැවේ යම් ආපදාවක්, හදිසි තත්ත්වයක් සහ ආරක්ෂිත ගමනාගමනය සම්බන්ධයෙන් වන සියලු රේඩියෝ සන්නිවේදනවල සාරාංශයක්;

(ආ) සන්නිවේදන සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන සියලු තැනැත්තන්ගේ සහතික කිරීමේ තොරතුරු ඇතුළුව ඔවුන්ගේ නම්;

(ඇ) නැව සම්බන්ධයෙන් වන සියලු වැදගත් සේවා සිදුවීම් සහ ඒවා සිදු වූ වේලාව;

(ඈ) දෛනිකව නැව පිහිටන ස්ථානය; සහ

(ඉ) 16 වන නියෝගයේ සඳහන් කර ඇති සුදුසු පරීක්ෂණවල සහ පරීක්ෂා කිරීම්වල දිනය, වේලාව සහ කරුණු.

(2) නෞකාධිපතිවරයා විසින් එක් එක් දිනයේ ගුවන් විදුලි ලොග් පොතෙහි කර ඇති සටහන් පරීක්ෂා කිරීම සහ අත්සන් කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

19. (1) ආපදා සංඥා ලබාදීමක දී නැව පිහිටි ස්ථානය අන්තර්ගත කිරීමේ හැකියාව සහිත දෙආකාරයේ සන්නිවේදන උපකරණ කොටසක් සහිත නැවක් සඳහා මේ නියෝග අදාළ විය යුතු ය.

(2) නැවක මුහුදුගමන් ග්‍රාහකයන් සවිකර ඇති නම්, ග්‍රාහකයා විසින් නැව පිහිටි ස්ථානය ස්වයංක්‍රීයව නැවේ දෙයාකාරයේ සන්නිවේදන උපකරණයට ලබා දිය යුතු බැවින් ආපදා සංඥාවක දී නැව පිහිටි ස්ථානය අන්තර්ගත කරනු ලැබිය හැකි ය.

(3) නැවක මුහුදු ගමන් ග්‍රාහකය සවිකර නොමැති නම්, නැව මුහුදු ගමනක යෙදී සිටින අතරතුර පැය හතරක් නොඉක්මවන විරාමයන්හි දී නැව පිහිටි ස්ථානය සහ නැව ඒ ස්ථානයේ පිහිටි වේලාව අතින් යාවත්කාලීන කරනු ලැබිය යුතු බැවින් නැව පිහිටි ස්ථානය සහ වේලාව ඕනෑම විටක දී දෙආකාරයේ සන්නිවේදන උපකරණ මගින් සම්ප්‍රේෂණය කරනු ලැබිය හැකි ය.

## VI වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

20. ගුවන් විදුලි නියෝගවලට අනුකූලව නැව්පොළ ගුවන්විදුලි බලපත්‍රයක් නැවකට නිකුත් කරනු ලැබිය යුතු ය.

21. නැවක් ශ්‍රී ලංකාවේ යම් වරායකට හෝ ස්ථානයකට හෝ වරායක සිට හෝ ස්ථානයක සිට මුහුදු ගමනක් සඳහා මුහුදට නොයා යුතු අතර ශ්‍රී ලාංකික නැවක් බලාත්මක නැව්පොළ ගුවන්විදුලි බලපත්‍රයක් ඇත්නම් මිස, ජාත්‍යන්තර මුහුදු ගමනක් සිදු කරනු නොලැබිය යුතු ය.

22. අමාත්‍යවරයාගේ එකඟත්වය ද ඇතිව, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මේ නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි ආකාරයේ සම්මුතියේ හෝ 1988 ප්‍රොටොකෝලයේ විධිවිධානවල අවම තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලවීම සඳහා යම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.

23. සම්මුතියේ IV වන පරිච්ඡේදයේ පාදක සටහන් සහ එවැනි පාදක සටහන්වල සඳහන් කරනු ලබන යෝජනා සම්මතයන්, චක්‍රලේඛ හෝ ලේඛන, මේ නියෝගවල කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

24. ශ්‍රී ලංකාවේ පිහිටි යම් වරායක හෝ යම් ස්ථානයක ඇති යම් නැවක් අනාරක්ෂිත නැවක් ලෙස හඳුනාගනු ලබන අවස්ථාවක දී, එනම්, එවැනි නැවක නැව් බඳේ, උපකරණවල, යන්ත්‍ර සූත්‍රවල දෝෂ සහගත තත්ත්වයක්, සේවක පිරිස අඩු බව, අධිකව පැටවීම හෝ නුසුදුසු පැටවීම හේතුවෙන් හෝ සම්මුතිය සමඟ අනුකූල නොවන වෙනත් යම් තත්ත්වයක් හේතුවෙන්, එකී නැව සිදු කිරීමට අදහස් කරන සේවයේ ස්වභාවය අනුව මිනිස් ජීවිතවලට බරපතල හානි සිදු නොකරමින් මුහුදට ගමන් කිරීමට නොහැකි වන යම් අවස්ථාවක දී, එහි දෝෂ සහගත තත්ත්වය සමීක්ෂණය කිරීමේ හෝ එම දෝෂය නිවැරදි කිරීමේ කාර්යය සඳහා එකී නැව තාවකාලිකව රඳවා තබා ගනු ලැබිය හැකි ය.

25. මේ නියෝගවල-

"භාණ්ඩ නෞකා" යන්නෙන්, මඟී නෞකාවක් නොවන ඕනෑම නෞකාවක් අදහස් වේ;

"සම්මුතිය" යන්නෙන්, 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය හෝ කලින් කලට සංශෝධිනය වන පරිදි 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදු කරනු ලබන සංශෝධන අදහස් වේ;

"GMDSS" යන්නෙන්, විශ්ව සමුද්‍රීය ආපදා සහ ආරක්ෂක ක්‍රම පද්ධතිය අදහස් වේ;

"MF (මධ්‍යම සංඛ්‍යාතය)" යන්නෙන්, කිලෝ හර්ට්ස් 300 (300 KHz) ඉක්මවන සහ කිලෝ හර්ට්ස් 3000 (3000 KHz) නොඉක්මවන සංඛ්‍යාත පරාසය අදහස් වේ;

"සංවිධානය" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ;

"මඟී නෞකාව" යන්නෙන්, දොළහකට වැඩි මඟීන් පිරිසක් රැගෙන යන නෞකාවක් අදහස් වේ;

"අ1 වන මුහුදු ප්‍රදේශය" යන්නෙන්, අඛණ්ඩ ඩිජිටල් වරණීය කැඳවුම් සංඥා කිරීම ලබාගත හැකි යටත් පිරිසෙන් එක් ඉතා ඉහළ සංඛ්‍යාතයේ වෙරළබඩ පාලන මධ්‍යස්ථානයක රේඩියෝ දුරකතන ආවරණ ප්‍රදේශය තුළ ඇති මුහුදු ප්‍රදේශයක් අදහස් වේ;

"අ2 වන මුහුදු ප්‍රදේශය" යන්නෙන්, අඛණ්ඩ ඩිජිටල් වරණීය කැඳවුම් සංඥා කිරීම ලබාගත හැකි යටත් පිරිසෙන් එක් මධ්‍යම සංඛ්‍යාතයේ වෙරළබඩ පාලන මධ්‍යස්ථානයක රේඩියෝ දුරකතන ආවරණ ප්‍රදේශය තුළ ඇති, අ1 වන යම් මුහුදු ප්‍රදේශයක් නොවන මුහුදු ප්‍රදේශයක් අදහස් වේ;

"අ3 වන මුහුදු ප්‍රදේශය" යන්නෙන්, අඛණ්ඩ සංඥා කිරීම ලබාගත හැකි, භූස්ථාපිත චන්ද්‍රිකාවක ආවරණ ප්‍රදේශය තුළ ඇති, අ1 වන යම් මුහුදු ප්‍රදේශයක් හෝ අ2 වන යම් මුහුදු ප්‍රදේශයක් නොවන මුහුදු ප්‍රදේශයක් අදහස් වේ;

"අ4 වන මුහුදු ප්‍රදේශය" යන්නෙන්, අ1 වන මුහුදු ප්‍රදේශය, අ2 වන මුහුදු ප්‍රදේශය හෝ අ3 වන මුහුදු ප්‍රදේශය නොවන මුහුදු ප්‍රදේශයක් අදහස් වේ;

"ගුවන් විදුලි නියෝග'' යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ කලින් කලට බලාත්මකව පවතින පරිදි ජාත්‍යන්තර විදුලි සංදේශ, සම්මුතියට අමුණනු ලබන හෝ අමුණන ලද බවට සලකනු ලබන ගුවන් විදුලි නියෝග අදහස් වේ;

"පිළිගත් සංවිධානය" යන්නෙන්, සංවිධානය විසින් පිළිගන්නා ලද පිළිගත් සංවිධාන සඳහා වන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව පිළිගෙන ඇති යම් සංවිධානයක් අදහස් වේ;

"VHF (ඉතා ඉහළ සංඛ්‍යාතය)" යන්නෙන්, මෙගා හර්ට්ස් 30 (30 MHz) ඉක්මවන්නා වූ සහ මෙගා හර්ට්ස් 300 (300 MHz) නොඉක්මවන්නා වූ සංඛ්‍යාත පරාසය අදහස් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.